# රබර් කිරි කැපීම

ආචාර්ය චන්ද්‍රා සමරනායක

රබර් ගසකින් කිරි ලබා ගැනීම ක්‍රමානුකූලව කල යුතු දෙයකි. එවිට අඩු වශයෙන් අවුරුදු 24 ක් පමණ කාලයක් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට හැකි වනු ඇත.

දැනට කිරි කැපීමට භාවිතා කර ගන්නා කැපුම් ක්‍රම තෝරා ගැනීමට මුල් වී ඇත්තේ රබර් ගසක කිරි ලබා ගන්නා පොත්තෙහි, ඇති පටක වල ව්‍යුහයයි.

ගසකින් කිරි ලබා ගන්නා විට ඒ ගසෙහි වර්ධනයට බාධාවක් වේ. මෙසේ වීමට හේතුව, රබර් කිරි නිෂ්පාදනයට වැය වෙන මූල ද්‍රව්‍ය ගස ලබාගන්නේ එහි වැඩීම සඳහා නිපදවාගන්නා ආහාර ද්‍රව්‍ය වලින් බැවිනි.

යම් කිසි කිරි කැපුම් ක්‍රමයක් හොඳ යැයි පිළිගැනීමට නම් ඒ ක්‍රමයෙන් පහත සඳහන් කරුණු සම්පූර්ණ විය යුතුයි.

1. කිරි කැපීමට වැය වන වියදම ඉතා අඩු වීම
2. වැඩි කිරි ප්‍රමාණයක් ලබා ගැණීමට හැකි වීම
3. ගසෙහි වැඩීමට ඇති වන බාධාව ඉතා අඩු වීම
4. නැවත ලියලන පොත්ත හොඳින් වැඩීම
5. අඩුම ප්‍රමාණයක පොත්ත වැය වීම
6. පොත්තට වැළඳෙන රෝග ඉතා අඩුවීම

රබර් පර්යේෂණායතනය මගින් නිර්දේශ කර ඇති කිරි කැපුම් ක්‍රම මේ කරුණු බොහොමයක් සපුරාලයි. එබැවින් ඔබ වගාවෙන් දීර්ඝ කාලයක් හොඳ ආදායමක් ලබා ගැනීමට නම නිර්දේශිත පිළිවෙලට කිරි කැපීම කරන්න.

## කිරි කැපීම ආරම්භ කිරීම

ගසකින් කිරි කැපීම කල යුතු කාලය නිගමනය කල යුත්තේ වගාවේ වයස අනුව නොව වැඩීම අනුවයි. රබර් වගාවේ නඩත්තුව හා වගා කර ඇති ක්ලෝනය අනුව මෙම කාලය වෙනස්විය හැක. නිසි පොහොර යොදා හොඳින් රැක බලාගත්, සීඝ්‍රයෙන් වැඩෙන, අළුත් ක්ලෝන සිටවූ වගාවක් නම්, අවුරුදු 5කදී කිරි කැපීම ආරම්භ කිරීමට හැකිවනු ඇත.

ගසක බද්ධ සන්ධියේ ඉහලම ස්ථානයේ සිට සෙ.මී. 90 (අඩි 3ක්) ඉහලින් කඳේ වට ප්‍රමාණය සෙ.මී.

50ක් වන ගස් කිරි කැපීමට සුදුසුය. වගාවක කිරි කැපීම ආරම්භ කිරීමට මෙවැනි ගස් අඩුම ගණනේ 60%ක් වත් තිබිය යුතුය.

### කැපුම් කට්ටය ආරම්භ කලයුතු උස

ගසෙහි බද්ධ සන්ධියේ ඉහලම ස්ථානයේ සිට 42'' ක් හෝ 48'' ක් ඉහලින් කැපුම් කට්ටයේ පහල කොන පිහිටන පරිදි කැපුම් කට්ටය ලකුණු කල හැක. අඟල් 48ක් ඉහලින් කැපුම් කට්ටය ලකුණු කල විට කිරි කපන්නා, උසින් අඩු අයෙකු නම්, එවැනි උසක කැපුමක් කැපීමට ඔහුට තරමක් අපහසු වනු ඇත.

### කැපුමේ කෝණය

බද්ධ රබර් ගස්වල කැපුම, තිරසට අංශක 30°ක් ඇලවී සිටින පරිදි ලකුණු කල යුතුයි. කැපුම් කට්ටයේ ඉහල කොන ගසෙහි වම් පැත්තෙන් පටන් ගෙන, පහල කොන ගසෙහි දකුණු පැත්තට පිහිටන සේ අංශක 30°කට ඇල කර, කැපුම් කට්ට යොදා ගැනීමෙන්, කිරි නාල වැඩි ගණනක් විවෘත වේ. එම නිසා මෙසේ කැපුම් කට්ටය දමා කිරි කැපීමෙන් වැඩි කිරි ප්‍රමාණයක් ලැබෙන බව පර්යේෂණ මඟින් සොයා ගෙන ඇත.

### කැපුමේ දිග

නිර්දේශිත කැපුමක දිග වට භාග යකි. සාමාන්‍යයෙන් මේ වට භාගයේ කැපුම බස්නාහිරට හෝ නැගෙනහිරට මුහුණ ලා සළකුණු කරණු ලැබේ.

### කැපුම් කට්ටය ලකුණු කිරීම

කැපුම් කට්ට ලකුණු කිරීම සඳහා විශේෂයෙන් පිළියෙල කරන ලද ඇලුමිනියම් තහඩුවක ආධාරයෙන් කැපුම් කට්ටය ලකුණු කළ යුතුය. පළමුවෙන් ලකුණු කළ කොටස කපා අවසන් වූ පසු නැවතත් තහඩුව ආධාරයෙන්ම කැපුම ලකුණු කර ගැනීමෙන් පොත්ත වැය වීම පාලනය කල හැකි අතර, නියමිත ලෙස කැපුම් කට්ටයේ ඇලවීමද දිගටම පවත්වා ගත හැකිවේ.

### කැපුමේ ගැඹුර

කිරි නාල වැඩි ගණනක් පිහිටා ඇත්තේ දිය පට්ටයේ සිට පිටතට ඇති මිලි මීටරය ඇතුලතයි. වැඩි කිරි ප්‍රමාණයක් ලබා ගැනීමට වැඩි කිරි නාල ප්‍රමාණයක් සිදුරු කල යුතු අතරම දිය පට්ටයට තුවාල සිදු නොකිරීමට වග බලා ගත යුතුයි. දිය පට්ටයට තුවාල සිදු වුවහොත් පොත්තේ නැවත ලියලීමට බාධා ඇතිවේ.

### කපා ඉවත්කල යුතු පොත්තේ ඝණකම

කිරි කැපීමේදී කපා ඉවත් කරන පොත්තේ ඝනකම ඉතා තුනී විය යුතුය. අඟලකින් 1/20 ක් ඝනකම ඇති පොත්තක් කපා ඉවත් කිරීම ප්‍රමාණවත් බව පර්යේෂණ වලින් පෙනී ගොස් ඇත. දිගු කලක් කිරි නොකපා තිබූ ගසක මෙයට වඩා ඝනකම පොත්තක් කපා ඉවත් කිරීමට සිදුවේ. නියමිත පරිදි 1/20''ක් ඝනකම පොත්තක් කපා ඉවත් කර, කිරි ලබා ගැණීමෙන් එක වෙට්ටුවක් කපා ඉවත් කිරීමට අවුරුදු 6ක කාලයක් ගතවිය යුතුය.

### කැපුමේ තීව්‍රතාවය

නිර්දේශිත කැපුම් ක්‍රමය වට භාගයේ කැපුමක්, දවසක් හැර දවසක් කැපීමයි. සමහරක් කුඩා ඉඩම් හිමියන් පුරුදු වී ඇති දිනපතා කිරි කැපීම ඉතාමත්, නුසුදුසු ක්‍රමයකි. මෙයින් වන්නේ දිගු කලක් පලදාව ලබා ගත හැකි ගසකින් ටික කලකදීම කිරි ලබාගැනීමට නොහැකි වී යාමයි.

## වෙට්ටු මාරු කිරීම

එක වෙටුවක් කපා අවසන් කර අනෙක් වෙට්ටුවේ කැපුම ආරම්භ කල යුතුයි. එක පැත්තක වෙට්ටුවක් කපා අවසන් කිරීමට අවම වශයෙන් අවුරුදු 5ක වත් කාලයක් වැය කල යුතුයි. එසේ නොමැතිව, එක් පැත්තක් ඉක්මනින් කපා අවසන් කර, අනෙක් පැත්ත කැපීම ආරම්භ කල හොත්, පලමු පැත්තේ නැවත ලියලන පොත්තට වැඩීම සඳහා සෑහෙන තරම් කාලයක් නොලැබීයයි. මේ හේතුවෙන් නැවත ලියලූ පොත්තෙන් ලබා ගත හැකි කිරි ප්‍රමාණය ඉතාමත් අඩුවේ.

## කිරි කැපීමට හොඳම කාලය

කිරි කැපීමේ වේලාව ඉතා වැදගත්ය, කිරි කැපීමට හොඳම කාලය හිමිදිරි පාන්දරය. පමාවී කැපීම කිරි අඩුවීමට හේතුවකි. ගස් තෙත්ව පවතී නම් පමණක් පමාවී කිරි කැපීම කරන්න. තෙත ගස් කැපීමෙන් පොතු කුණු වීම වැනි රෝග වලට පාත්‍රවීමට බොහෝ ඉඩ ඇති බැවින්, වැසි කාලයේදී, ගස් වියලුනාට පසු පමාවී කිරි කැපීම කල හැක.

## එක් කිරි කපන්නෙකුට දිනකට කැපිය හැකි ගස් ප්‍රමාණය

මෙය බොහෝ දුරට ඉඩම පිහිටා ඇති ආකාරය මත රඳා පවතී. දිනකට වැඩි ගස් සංඛ්‍යාවක් කැපීමට යැමෙන්, සමහර ගස් ප්‍රමාදවී කැපෙන නිසා එය කිරි අඩු වීමට හේතුවක් වේ. සාමන්‍ය වශයෙන් එක් කිරි කපන්නෙකුට දිනකට ගස් 250 — 300 දක්වා කැපිය 'හැකි වේ.

## පොතු තැම්බීමේ රෝගය

අධික ත්‍රීව්‍රතාවයකින් කිරි කැපීම නිසා ගස් මෙම රෝගයට භාජනය වේ. මෙය වලක්වා ගැනීම සඳහා නිර්දේශිත කැපුම් ක්‍රම යොදා ගන්න.

ගසක් පොතු තැම්බීමේ රෝගයට භාජනය වූවාට පසු එයට ප්‍රතිකාර කළ නොහැක. සුළු කාලයක් ගස් විවේක ගැන්වීම මගින්, නැවත තවත් සුළු කලකට කිරි කැපීම සමහර විට කල හැකි වේ. නමුත් අවසානයේදී සම්පූර්ණයෙන්ම එම ගස්වල කිරි සිඳී යයි.

## වැඩි කැපුම් දැමීම

මුල් පොත්ත සහිත පහල වෙට්ටු (ඒ,බී) දෙක අවුරුදු 12 ක් සහ නැවත ලියලූ පොත්ත සහිත 'සී' වෙට්ටුව අවුරුදු 6ක් කපා 'ඩී' වෙට්ටුව පැමිණි කළ ලැබෙන එලදාව ටිකින් ටික අඩුවේ මේ කාලයේද පහල වෙට්ටු වලින් කිරි ලබා ගන්නා අතරම, සාමාන්‍ය වෙට්ටු වලට ඉහලින් ඇති පොත්තේ කැපුම් දමා ලැබෙන කිරි ප්‍රමාණය වැඩි කර ගත හැක. මෙසේ වැඩි කැපුම් දැමීමද ක්‍රමානුකූලව කල යුතු අතර එසේ කිරීම ආරම්භ කලායින් පසු ඉදිරි අවුරුදු 6 ක කාලයකින් පසු රබර් වගාව නැවත වගා කිරීමට බලාපොරොත්තු විය යුතුයි.